# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2184/9 - 2020 ජූලි මස 13 වැනි සඳුදා - 2020.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නිවේදනය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවර අනුරාධා යහම්පත් වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධි විධාන) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය මහ නගර සභා ආඥාපනතේ 289(1) වගන්තියෙන් විෂය භාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ සහායකයින් සඳහා වන පහත සඳහන් දීමනාවලට අදාළ රීති මේ මගින් පනවනු ලැබේ. මෙම රීති 2020 ජූනි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2020 ජූනි මස 23 වැනි දින,
නැගෙනහිර පළාත,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

**රීති**

**01. මහ නගර සභා නගරාධිපතිවරුන්ට මහ නගර සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම :–**

1.1. මහ නගර සභාවේ වාහනයක් මහා නගර සභා සීමාව තුළ භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 80ට නොවැඩි ප්‍රමාණයක් සහ අදාළ වාහනය මහ නගර සභා සීමාවෙන් පිටත රාජකාරි කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 100ට නොවැඩි ප්‍රමාණයක් මහ නගර සභා අරමුදලින් දැරිය හැකිය.

1.2. මහ නගර සභාවේ වාහනයක් නොවන අවස්ථාවක ඉහත සඳහන් ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන කුලී වාහනය සඳහා/පෞද්ගලික වාහනය සඳහා ඉහත සඳහන් ඉන්ධන ප්‍රමාණය සහ කුලී පිරිවැය සභා අරමුදලින් වැය දැරිය හැකිය. කුලියට ලබා ගන්නා වාහනය සඳහා මාසික කුලී මුදල විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබේ.

1A - PG 5058 - 18 (2020/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*සටහන:*

දිස්ත්‍රික්කයෙන් පිට වාහනය ගෙන යෑමේ දී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතු වේ.

**02. ප්‍රවාහන පිරිවැය සහ ඒ සමග ඇති දීමනාව :–**

2.1 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගිවීම සඳහා මහ නගර සභාවේ නගරාධිපතිවරයාට සම්පූර්ණ දිනකට රු. 1,500.00 කට නොවැඩි ඒකාබද්ධ දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.2 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගී වීම සඳහා මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයාට සහ සභිකයින් සඳහා සම්පූර්ණ දිනකට රු. 1,250.00 කට නොවැඩි ඒකාබද්ධ දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.3 කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගී වන අවස්ථාවේ දී නවාතැන් පහසුකම් දීමනාව වශයෙන් පහත සඳහන් මුදලට නොවැඩි මුදලක් මහ නගර සභාවේ අරමුදලින් ගෙවිය හැකි අතර මේ සඳහා මුල් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ:

| | | |
|---|---|---|
| 2.3.1 | මහා නගර සභාවේ නගරාධිපති | රු. 3,000.00 |
| 2.3.2 | මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති | රු. 2,500.00 |
| 2.3.3 | සභිකයන් | රු. 2,000.00 |

*සටහන:*

I. ඉහත සඳහන් ගෙවීම් මහ නගර සභාව පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කයෙන් පිට පැවැත්වෙන සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගිවීම සඳහා පමණක් ගෙවිය යුතු වේ.

II. කාර්යාල මට්ටමේ රැස්වීම් සහ අනෙකුත් උත්සව සඳහා විධිමත් ආරාධනා අදාළ මහනගර සභාවේ නගරාධිපති/නියෝජ්‍ය මහ නගර නගරාධිපති/සභායකයන්ට ලබා නොදෙන අවස්ථාවේ දී ඉහත ගෙවීම් ගෙවනු නොලැබේ.

**03. ආහාර සහ සංග්‍රහ දීමනා :–**

3.1 මහ නගර සභා නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 3,000.00 ක දීමනාවක් මහ නගර සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය. මෙම ප්‍රතිපූර්ණ අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.2 මහ නගර සභා නියෝජ්‍ය නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 1,500.00 ක දීමනාවක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය. මෙම ප්‍රතිපූරණ අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.3 මහා නගර සභාවේ මාසික රැස්වීම්වලට සහභාගි වන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගි වන එක් සභිකවරයෙකුට එක් රැස්වීමකට රු. 100.00 ක (පැය 07 ක් ඇතුළත) උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙවැනි රැස්වීම පැය 07 කට වැඩි වේ නම් සහභාගි වන එක් සභිකයාට එක් රැස්වීමකට රු. 400.00 ක් ආහාර හා සංග්‍රහ දීමනා සඳහා උපරිම වශයෙන් සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙම ප්‍රතිපූරණ අරමුණ සඳහා සත්‍ය වැය කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ.

**04. දුරකථන දීමනා :–**

4.1 නගරාධිපතිවරයාට මාසිකව රු. 4,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථන දීමනාව වශයෙන් මහා නගර සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

4.2 නියෝජ්‍ය නගරාධිපතිවරයාට මාසිකව රු. 2,500.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් ඕනෑම එකක් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථනය දුරකථන දීමනාව වශයෙන් මහා නගර සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

4.3 මහ නගර සභාවේ සභිකවරුන්ට මාසිකව ජංගම දුරකථනය සඳහා රු. 1,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් ඕනෑම එකක් අවම මුදල දුරකථන දීමනාව වශයෙන් මහ නගර සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

*සටහන:*

ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කරනු ලබන දුරකථන සඳහා බිල්පත් අදාළ නගරාධිපති/නියෝජ්‍ය නගරාධිපති/මහා නගර සභා සභිකයින්ගේ නමට තිබීම අවශ්‍ය වේ.

**05. මහා නගර සභා විශේෂ රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව :–**

5.1 නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින්ට මාසික රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500.00 දීමනාවක් (උපරිම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

5.2 නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින්ට මහා නගර සභාවේ ආඥාපනතට අනුව ඇති කරන ලද ව්‍යවස්ථාපිත කමිටු රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 250.00 දීමනාව වශයෙන් සභා අරමුදලින් ගෙවිය හැකිය. මෙම ගෙවීම් අදාළ මාසයේ උපරිම වශයෙන් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් තුනකට (3) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් දෙකකට (2) සහභාගි වීම සඳහා පමණක් ලබා දිය හැකිය.

**06. මහ නගර සභා නගරාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනාව :–**

6.1 මහා නගර සභාවේ නගරාධිපතිවරයාට පෞද්ගලික සහකාරවරයෙකු විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අවසරය මත පත් කර ගත හැකි අතර, එම පෞද්ගලික සහකාරවරයා අවම වශයෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රධාන විෂයයන් තුනෙහි (3) සමත් වී සිටිය යුතු වේ. (පරණ විෂය නිර්දේශයේ ප්‍රධාන විෂයයන් (4) හෝ වසර දෙකකට නොඅඩු කාර්යාල ලේකම් ඩිප්ලෝමා සහතිකය (Office Secretaryship) හෝ ඊට සමාන පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. ඔහුට දීමනාව වශයෙන් මාසිකව රු. 20,000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් ගෙවිය හැකිය.

**07. මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය අනුව ඉහත සඳහන් ගෙවීම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය මත අඩු කළ හැකිය :–**

07 - 734/1

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවර අනුරාධා යහම්පත් වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 193(1)(උ), (ඌ)(ඍ) වගන්තියෙන් විෂයභාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද නගර සභා සභාපති, උප සභාපති සහ සභිකයින් සඳහා වන පහත සඳහන් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2020 ජුනි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2020 ජුනි මස 23 වැනි දින,
නැගෙනහිර පළාත,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

**රීති**

**01. නගර සභා සභාපතිවරයාට නගර සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම :–**

1.1. නගර සභාවේ වාහනයක් නගර සභා සීමාව තුළ භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 80ට නොවැඩි ප්‍රමාණයක් සහ අදාළ වාහනය නගර සභා සීමාවෙන් පිටත රාජකාරි කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 100ට නොවැඩි ප්‍රමාණයක් මහ නගර සභා අරමුදලින් දැරිය හැකිය.

1.2. නගර සභාවේ වාහනයක් නොවන අවස්ථාවක ඉහත සඳහන් ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන කුලී වාහනය සඳහා/පෞද්ගලික වාහනය සඳහා ඉහත සඳහන් ඉන්ධන ප්‍රමාණය සහ කුලී පිරිවැය සභා අරමුදලින් වැය දැරිය හැකිය. කුලියට ලබා ගන්නා වාහනය සඳහා මාසික කුලී මුදල විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබේ.

*සටහන:*

I. දිස්ත්‍රික්කයෙන් පිට වාහනය ගෙන යෑමේ දී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතු වේ.

II. දිස්ත්‍රික්කය තුළ වාහනය ගෙන යෑමේදී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතු වේ.

**02. ප්‍රවාහන පිරිවැය සහ ඒ සමග ඇති දීමනාව :–**

2.1 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගීවීම සඳහා නගර සභාවේ සභාපතිවරයාට සම්පූර්ණ දිනකට රු. 1,250.00 කට නොවැඩි දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.2 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගීවීම සඳහා නගර සභාවේ උප සභාපති සහ සභිකයින් සඳහා සම්පූර්ණ දිනකට රු. 1,000.00 කට නොවැඩි ඒකාබද්ධ දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.3 කාර්යාල මට්ටමේ සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගී වන අවස්ථාවේ දී නවාතැන් පහසුකම් දීමනාව වශයෙන් පහත සඳහන් මුදලට නොවැඩි මුදලක් නගර සභාවේ අරමුදලින් ගෙවිය හැකි අතර මේ සඳහා මුල් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ:

| | | |
|---|---|---|
| 2.3.1 | සභාපති | රු. 2,500.00 |
| 2.3.2 | උප සභාපති | රු. 2,000.00 |
| 2.3.3 | සභායකයන් | රු. 1,500.00 |

*සටහන:*

I. ඉහත සඳහන් ගෙවීම් මහා නගර සභාව පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කයෙන් පිට පැවැත්වෙන සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගී වීම සඳහා පමණක් ගෙවිය යුතු වේ.

II. කාර්යාල මට්ටමේ රැස්වීම් සහ අනෙකුත් උත්සව සඳහා විධිමත් ආරාධනා අදාළ මහා නගර සභාවේ නගරාධිපති/නියෝජ්‍ය මහ නගර නගරාධිපති/සභායකයන්ට ලබා නොදෙන අවස්ථාවේ දී ඉහත ගෙවීම් ගෙවනු නොලැබේ.

**03. ආහාර සහ සංග්‍රහ දීමනා :–**

3.1 නගර සභා සභාපතිවරයා වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 2,500.00 ක දීමනාවක් සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය. මෙම ප්‍රතිපූර්ණ අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.2 නගර සභා උප සභාපති වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 1,250.00 ක දීමනාවක් සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය. මෙම ප්‍රතිපූරණ අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.3 නගර සභාවේ මාසික රැස්වීම්වලට සහභාගි වන සභායකයන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගි වන එක් සභිකවරයෙකුට එක් රැස්වීමකට රු. 100.00 ක (පැය 07 ක් ඇතුළත) උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙවැනි රැස්වීම පැය 07 කට වැඩි වේ නම් සහභාගි වන එක් සභායකයන්ට එක් රැස්වීමකට රු. 400.00 ක් ආහාර හා සංග්‍රහ දීමනා සඳහා උපරිම වශයෙන් සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙම ප්‍රතිපූර්ණ අරමුණු සඳහා ඊට අදාළ සත්‍ය වැය කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ.

**04. දුරකථන දීමනා :–**

4.1 නගර සභාවේ සභාපතිවරයාට මාසිකව රු. 3,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථන දීමනාව වශයෙන් නගර සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය.

4.2 නගර සභාවේ උප සභාපතිවරයාට මාසිකව රු. 2,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් ඕනෑම එකක් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථනය දුරකථන දීමනාව වශයෙන් මහා නගර සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය.

4.3 නගර සභාවේ සභිකවරුන්ට මාසිකව ජංගම දුරකථනය සඳහා රු. 1,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් ඕනෑම එකක් අවම මුදල දුරකථන දීමනාව වශයෙන් නගර සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

*සටහන:*

ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කරනු ලබන දුරකථන සඳහා බිල්පත් අදාළ සභාපති/උප සභාපති/නගර සභා සභිකයින් ගේ නමට තිබීම අවශ්‍ය වේ.

**05. නගර සභා විශේෂ රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු/උපදේශක කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව :–**

5.1 නගර සභාවේ සභාපති, උප සභාපති හා සභිකයින්ට මාසික රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500,00 දීමනාවක් (උපරිම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

5.2 සභාපති, උප සභාපති හා සභිකයින්ට නගර සභාවේ ආඥාපනතට අනුව ඇති කරන ලද ව්‍යවස්ථාපිත කමිටු/උපදේශක කමිටු රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 250.00 දීමනාව වශයෙන් සභා අරමුදලින් ගෙවිය හැකිය. මෙම ගෙවීම් අදාළ මාසයේ උපරිම වශයෙන් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් තුනකට (3) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් දෙකකට (2) සහභාගී වීම සඳහා පමණක් ලබා දිය හැකිය.

**06. නගර සභා සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනාව :–**

6.1 නගර සභාවේ නගරාධිපතිවරයාට පෞද්ගලික සහකාරවරයෙකු විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අවසරය මත පත් කර ගත හැකි අතර, එම පෞද්ගලික සහකාරවරයා අවම වශයෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රධාන විෂයයන් තුනෙහි (3) සමත් වී සිටිය යුතු වේ. (පරණ විෂය නිර්දේශයේ ප්‍රධාන විෂයයන් (4) හෝ වසර දෙකකට නොඅඩු කාර්යාල ලේකම් ඩිප්ලෝමා සහතිකය (Office Secretary Ship) හෝ ඊට සමාන පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. ඔහුට දීමනාව වශයෙන් මාසිකව රු. 20,000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් ගෙවිය හැකිය.

**07. නගර සභාවේ මූල්‍ය තත්ත්වය අනුව ඉහත සඳහන් ගෙවීම් විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය මත අඩු කළ හැකිය :–**

07 - 734/2

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවර අනුරාධා යහම්පත් වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධි විධාන) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥාපනතේ 184(1)(ඇ)(ඇ)(ඉ) වගන්තියෙන් විෂය භාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති සහ සභිකයින් සඳහා වන පහත සඳහන් දීමනාවලට අදාළ රීති මේ මගින් පනවනු ලැබේ. මෙම රීති 2020 ජුනි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2020 ජුනි මස 23 වැනි දින,
නැගෙනහිර පළාත,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

**රීති**

**01. ප්‍රාදේශීය සභා සභාපතිවරයාට ප්‍රාදේශීය සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම :–**

1.1. ප්‍රාදේශීය සභාවේ වාහනයක් ප්‍රාදේශීය සභා සීමාව තුළ භාවිතා කළ යුතු අතර, ප්‍රාදේශීය සභාවේ වර්ග ප්‍රමාණය $100km^2$ අඩුවෙන් හෝ සමානව පවතී නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 80ට නොවැඩි ප්‍රමාණයක් සහ.

1.2. ප්‍රාදේශීය සභාවේ වාහනය ප්‍රාදේශීය සභා සීමාව තුළ භාවිතා කරන අතර ප්‍රාදේශීය සභාවේ වර්ග ප්‍රමාණය $100km^2$ අධිකව පවති නම්, මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 90ට නොවැඩි ප්‍රමාණයක්, සහ

1.3 අදාළ වාහනය ප්‍රාදේශීය සභා බල සීමාවෙන් පිටත සහ රාජකාරි කටයුතු සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මසකට ඉන්ධන පෙට්‍රල්/ඩීසල් ලීටර් 100ට නොවැඩි ප්‍රමාණයක් සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

1.4 ප්‍රාදේශීය සභාවේ වාහනයක් නොවන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන කුලී වාහනය සඳහා/පෞද්ගලික වාහනය සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය. කුලියට ලබා ගන්නා වාහනය සඳහා මාසික මුදල විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබේ.

*සටහන:*

I. දිස්ත්‍රික්කයෙන් පිට වාහනය ගෙන යෑමේ දී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතු වේ.

II. දිස්ත්‍රික්කය තුළ වාහනය ගෙන යෑමේදී අදාළ අවසරය නිශ්චිත ආකෘතිය මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතු වේ.

**02. ප්‍රවාහන පිරිවැය සහ ඒ සමග ඇති දීමනාව :–**

2.1 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගිවීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට සම්පූර්ණ දිනකට රු. 1,250.00 කට නොවැඩි දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.2 ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කාර්යාල සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගිවීම සඳහා ප්‍රාදේශීය සභාවේ උපසභාපති සහ සභිකයින් සඳහා සම්පූර්ණ දිනකට රු. 1,000.00 කට නොවැඩි දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබාගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි. දින 10 ඉක්මවන්නේ නම් විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

2.3 කාර්යාල සම්මන්ත්‍රණ හා උත්සවවලට සහභාගී වන අවස්ථාවේදී නවාතැන් පහසුකම් දීමනාව වශයෙන් පහත සඳහන් මුදලට නොවැඩි මුදලක් ප්‍රාදේශීය සභාවේ අරමුදලින් ගෙවිය හැකි අතර මේ සඳහා මුල් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| 2.3.1 | සභාපති | රු. 2,500.00 |
| 2.3.2 | උප සභාපති | රු. 2,000.00 |
| 2.3.3 | සභිකයන් | රු. 1,500.00 |

*සටහන:*

I. ආයතන සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලබන අතර ප්‍රාදේශීය සභාව පිහිටා ඇති දිස්ත්‍රික්කයෙන් පිට කාර්යාල මට්ටමේ උත්සව සහ රාජකාරි කටයුතු ගමන් බිමන් සඳහා මෙම දීමනාව සීමා කර ඇත.

II. ප්‍රාදේශීය සභාව පිහිටි දිස්ත්‍රික්කය තුළ ගමන් බිමන් සඳහා කිසිදු ගෙවීමක් ගෙවනු නොලැබේ.

III. පෞද්ගලික ගමන් බිමන් සඳහා කිසිදු ගෙවීමක් ලබා දෙනු නොලැබේ. එමෙන්ම අදාළ ප්‍රාදේශීය සභාවේ කාර්යාල මට්ටමේ නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක් මත උත්සව සහ රැස්වීම් හෝ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට දිස්ත්‍රික්කයෙන් පිට ගමන් බිමන් සඳහා ගෙවීම් ලබා ගැනීමට හිමිකම් ඇත.

**03. ආහාර සහ සංග්‍රහ දීමනා :–**

3.1 ප්‍රාදේශීය සභා සභාපතිවරයා වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 2,000.00 ක දීමනාවක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය. මෙම ප්‍රතිපූරණය අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.2 ප්‍රාදේශීය සභා උප සභාපති වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රු. 1,000.00 ක දීමනාවක් සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය. මෙම ප්‍රතිපූරණය අරමුණු සඳහා ඊට අදාළ වියදම් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු වේ.

3.3 ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීම්වලට සහභාගී වන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගී වන එක් සභිකවරයෙකුට එක් රැස්වීමකට රු. 100.00 ක (පැය 07 ක් ඇතුළත) උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙවැනි

රැස්වීම පැය 07 කට වැඩි වේ නම් සහභාගී වන එක් සභිකයාට එක් රැස්වීමකට රු. 400,00 ක් ආහාර හා සංග්‍රහ දීමනා සඳහා උපරීම වශයෙන් සභා අරමුදලින් වියදම් දැරිය හැකිය. මෙම ප්‍රතිපූර්ණය අරමුණ සඳහා සත්‍ය වැය කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු වේ.

**04. දුරකථන දීමනා :–**

4.1 ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට මාසිකව රු. 2,500.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථන දීමනාව වශයෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

4.2 උප සභාපතිවරයාට මාසිකව රු. 1,500.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල දුරකථන දුරකථන දීමනාව වශයෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය. සභාපතිවරයාට මාසිකව රු. 3,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථන දීමනාව වශයෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූරණය කළ හැකිය.

4.3 ප්‍රාදේශීය සභාවේ සභිකවරුන්ට මාසිකව ජංගම දුරකථනය සඳහා රු. 1,000.00 ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල දුරකථන දීමනාව වශයෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකිය.

*සටහන:*

ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන දුරකථන සඳහා බිල්පත් අදාළ සභාපති/උප සභාපති/ප්‍රාදේශීය සභා සභිකයින් ගේ නමට තිබීම අවශ්‍ය වේ.

**05. ප්‍රාදේශීය සභා රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු/උපදේශක කමිටු රැස්වීම් සඳහා සහභාගීවීම වෙනුවෙන් දීමනාව :–**

5.1 සභාපති, උප සභාපති හා සභිකයින්ට මාසික රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500,00 දීමනාවක් (උපරීම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

5.2 සභාපති, උප සභාපති හා සභිකයින්ට ප්‍රාදේශීය සභාවේ පනතට අනුව ඇති කරන ලද ව්‍යවස්ථාපිත කමිටු/උපදේශක කමිටු රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 250.00 ක දීමනාව වශයෙන් සභා අරමුදලින් ගෙවිය හැකිය. මෙම ගෙවීම් අදාළ මාසයේ උපරීම වශයෙන් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් තුනකට (3) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් දෙකකට (2) සහභාගි වීම සඳහා පමණක් ලබා දිය හැකිය.

**06. ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය අනුව ඉහත සඳහන් ගෙවීම් විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය මත අඩු කළ හැකිය :–**

07 - 734/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.